# උපාධි අපේක්ෂකයින් සඳහා මාර්ගගත විභාග මාර්ගෝපදේශ
# ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
# 2019/2020

---

**පවතින කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් 2020 වසරේ අංක 19 දරණ අධ්‍යයන වැඩසටහන් (විශේෂ ප්‍රතිපාදන) විධිවිධාන අනුව ශාස්ත්‍ර පීඨය එහි උපාධි අපේක්ෂකයින් සඳහා වන විභාග මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වනු ඇත.**

**මෙම මාර්ගෝපදේශ ECN4270 සහ ECN4267 පාඨමාලා සඳහා අදාළ නොවේ. කරුණාකර LMS තුළ මෙම පාඨමාලා සඳහා ලබා දී ඇති විශේෂ මාර්ගෝපදේශ වෙත යොමු වන්න.**

**පූර්ව විභාග සූදානම**

1. 2019/2020 දෙවන සෙමෙස්තරයේ විභාගය මාර්ගගත ආකාරයට පැවැත්වේ.
2. තොරතුරු හා ප්‍රලේඛන මධ්‍යස්ථානය (IDC) විසින් නිශ්චිතව දක්වා ඇති කාලසීමා අනුව ශිෂ්‍ය තොරතුරු පද්ධතිය (SIS) භාවිත කරමින් සියලු ම සිසුන් විභාග සඳහා ලියාපදිංචි විය යුතුය.
3. ලියාපදිංචි වූ සිසුන්ට ඔවුන්ගේ විභාග ප්‍රවේශ පත්‍ර විභාග අංශයෙන් ඔවුන්ගේ ශිෂ්‍ය තොරතුරු පද්ධති ගිණුමට යොමු කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර සම්බන්ධ ගැටලු සඳහා නියෝජ්‍ය ලේඛකාධිකාරී/විභාග ශාඛාව වෙත 011-2500712/ 011-2585972 ඇමතීමෙන් හෝ dr@exam.cmb.ac.lk යන ලිපිනයට විද්‍යුත් පණිවුඩයක් එවීමෙන් සිදු කළ හැකි ය.
4. විභාග කාලසටහන IDC මගින් **ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය** (LMS) හි පළ කරනු ඇත.
5. කාලසටහනට අනුව විභාග ප්‍රශ්නපත්‍ර පෙරවරු 9.00 වන විට LMS වෙතින් බාගත හැකි ය.
6. **ලිඛිත විභාගයට පිළිතුරු ලියා සම්පූර්ණ කර LMS වෙත යොමු කිරීමට සිසුන්ට පැය 24 ක කාලයක්** ලබා දෙනු ඇත.
7. පහත සඳහන් තොරතුරු ලබා දීම අදාළ අධ්‍යයන අංශ හා අධ්‍යයන ඒකක මගින් සිදු කරනු ඇත.
   a. විවෘත ග්‍රන්ථ ලිඛිත විභාගය, වාචික පරීක්ෂණ, පැවරුම් සහ ඉදිරිපත් කිරීම් වැනි ඇගයීම් ක්‍රම පිළිබඳව
   b. ලිඛිත විභාග සඳහා නියමිත වචන සීමාව සහ වාචික පරීක්ෂණ සඳහා කාල සීමාව
   c. වාචික පරීක්ෂණ සඳහා, කාලසටහන් සහ භාවිත කළ යුතු මාර්ගගත ක්‍රමය අදාළ අධ්‍යයන අංශ/ ඒකක විසින් දැනුම් දෙනු ලැබේ.
   d. විභාගය පැවැත්වෙන දිනයේ අදාළ කාලසීමාව තුළ දී විභාගය සම්බන්ධ ගැටලු පිළිබඳ විමසීම් කරන ආකාරය
8. විභාගවල ව්‍යුහයට අදාළ ඕනෑම විමසීමක් අංශ ප්‍රධාන / ඒකක ප්‍රධාන වෙත ලිඛිතව යොමු කළ යුතු ය.

**විභාග කාලසීමාව තුළ දී,**

1. සිසුන් තම LMS වෙත ප්‍රවේශ විය යුතු අතර, විභාග කාලසටහනට අනුව අදාළ පාඨමාලා පිටුවට පිවිස විභාග ප්‍රශ්න පත්‍ර හා අනෙක් තොරතුරු බාගත යුතු ය.
2. කාලසටහනට අනුව ඔබට නියමිත ප්‍රශ්න පත්‍රය පෙරවරු 9.00 වන විට LMS වෙතින් බාගත හැකි ය.

3. බාගත කිරීම සඳහා විභාග ප්‍රශ්නපත්‍රය LMS හි නොමැති අවස්ථාවක් වේ නම්, කරුණාකර ශාස්ත්‍ර පීඨයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී 0714418483 අමතන්න. එසේ නොමැති නම් drmedfac@med.cmb.ac.lk යන ලිපිනයට විද්‍යුත් පණිවිඩයක් යොමු කරන්න.
4. විභාගය සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කිරීමක් ලබා ගැනීමට අවශ්‍ය වේ නම් විභාගය පැවැත්වෙන දින පෙ.ව. 9.00 සිට 11.00 දක්වා කාලය තුළ අදාළ ආචාර්යවරයා/ආචාර්යවරිය අමතන්න.
5. එක් එක් ඇගයීම සඳහා ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුව ඒවා නියමිත කාලසීමාව තුළ සම්පූර්ණ කිරීම සිසුන් සතු වගකීමකි.
6. සාමාන්‍ය පරීක්ෂණයකදී මෙන් ඔබේ පිළිතුරු පරිගණකගත කිරීම හෝ යතුරු ලියනය කිරීමට **අවසර නොලැබේ.** නමුත් දෘශ්‍යාබාධිත සිසුන් වැනි විශ්වවිද්‍යාල පාලනාධිකාරිය විසින් අවසර ලබා දී ඇති සිසුන් සඳහා මෙම නියමය අදාළ නොවේ.
7. සියලුම ලිඛිත ඇගයීම් **අත් අකුරින් පමණක්** ලිවිය යුතුය. ඔබේ පිළිතුරු A4 ප්‍රමාණයේ කඩදාසියක ලියන්න (සීආර් කොළ හෝ ෆුල්ස්කැප් කොළ මේ සඳහා භාවිත කළ හැකි ය). පිළිතුරු ලිවීමේ දී **කළු බෝල් පොයින්ට් පෑනක්** භාවිත කිරීම සුදුසු වේ. ඔබේ අත් අකුරු පැහැදිලි ව ලිවීමට වග බලා ගන්න.
8. කරුණාකර ඔබේ විභාග අංකය පිළිතුරු පත්‍රයේ සෑම පිටුවකම ඉහළ දකුණු කෙළවරේ සටහන් කරන්න. පිළිතුරු පත්‍රයේ කිසිදු ස්ථානයක ඔබේ නම සඳහන් කිරීමෙන් වළකින්න.
9. පහත දැක්වෙන ආකෘතිය භාවිත කර පිළිතුරු පත්‍රයේ පහළ පිටු අංකනය කරන්න: උදා. එය පිටු 5 කින් සමන්විත නම් 1/5, 2/5… ආදී වශයෙන්.
10. ඔබේ පිළිතුරු පත්‍රයේ පළමු පිටුව ලෙස පොදු මුල් පිටුව (එය LMS මගින් ලබාගත හැකි ය.) භාවිත කරන්න (බලන්න; ඇමුණුම I). **අදාළ පොදු මුල් පිටුව මුද්‍රණය කිරීමෙන් හෝ අත් අකුරින් පිටපත් කිරීමෙන් ඔබට ලබා ගත හැකි වේ.**
11. පිළිතුරු පත්‍රයේ මුළු පිටු ගණන ඔබේ පිළිතුරු පත්‍රයේ මුල් පිටුවේ සඳහන් කළ යුතු ය.
12. පිළිතුරු පිටපතෙහි ඡායාරූප පරිලෝකනය කර එය **තනි PDF ගොනුවකට** පරිවර්තනය කරන්න. පරිලෝකනය කරන ලද රූපයේ සම්පූර්ණ පිටුව නිසියාකාරව ආවරණය වී ඇති බවට වග බලා ගන්න. පිළිතුරු පත්‍රයේ පරිලෝකනය කළ රූපය පැහැදිලි / කියවිය හැකි බවට වග බලා ගන්න. **LMS වෙත තනි පිටු වෙන වෙනම උඩුගත කිරීමට ඉඩ නොදෙන බව සලකන්න.**
13. **පිළිගත හැකි එකම ගොනු ආකෘතිය PDF බව අවධාරණය කරමි. අපේක්ෂකයාගේ විභාග අංකය PDF ගොනුවේ නාමය ලෙස භාවිත කළ යුතු ය. උදා. A 12345.**
14. ඔබගේ පිළිතුරු පත්‍රය J**PEG / JPG හෝ වෙනත් ගොනු වර්ගයකින්** උඩුගත කිරීමට ඔබට **අවසර නොලැබේ.**
15. ඔබගේ ලිඛිත පරීක්ෂණවල අවසාන අනුවාදය පැය 24 ක් ඇතුළත LMS වෙත උඩුගත කිරීමට කටයුතු කරන්න.
16. ඔබගේ පිළිතුරු පත්‍රය නිසි ආකාරයට යොමු කළ බව සනාථ කරගැනීම සඳහා 'ඉදිරිපත් කරන ලදී (Submited)' යන වචනය සමඟ LMSහි සම්පූර්ණ පිටුවේ තිර රුවක් (Screen shot) ගන්නා ලෙස සිසුන්ට උපදෙස් දෙනු ලැබේ.
17. නියමිත කාල සීමාවෙන් පසුව ඉදිරිපත් කරන ලද ලිඛිත පිළිතුරුපත්‍ර / වාචික ඇගයීම් ඇගයීම ක්‍රියාවලිය සඳහා භාර නොලැබේ.

**තාක්ෂණික ගැටලු මගහරවා ගැනීම**

1. පැන නගින ඕනෑම තාක්‍ෂණික හෝ අන්තර්ජාල සම්බන්ධතා ගැටලු නියම කරන ලද කාලය තුළ විසඳා ගත හැකි වන පරිදි කාලය කළමනාකරණය කිරීමට සිසුන් ක්‍රියා කළ යුතු ය.
2. විභාග කාල සීමාව තුළ තාක්ෂණික ගැටලු ඇති වුවහොත් (බාගත කිරීම හෝ උඩුගත කිරීම සම්බන්ධයෙන්) අපේක්ෂකයින් වහාම LMS පරිපාලක දක්ෂිණ දිසානායක මහතාගේ dakshina@arts.cmb.ac.lk යන විද්‍යුත් තැපැලට පණිවුඩයක් එවීම හෝ 0773797909 යන සෘජු දුරකථන අංකය අමතා උපදෙස් ලබා ගන්න.
3. LMS වෙත පිළිතුරු පත්‍රයක් උඩුගත කිරීමේදී යම් තාක්ෂණික ගැටලුවක් ඇති වේ නම්, අපේක්ෂකයෙකුට ඔවුන්ගේ පිළිතුරු පිටපත විද්‍යුත් තැපෑලෙන් පීඨය විසින් නියම කරන ලද පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයට යැවිය හැකි ය. **<u>එවැනි ඉදිරිපත් කිරීම්වල දී අපේක්ෂකයාගේ පාඨමාලා කේතය සහ විභාග අංකය හා විෂය පැහැදිලිව සඳහන් කළ යුතු ය.</u>**

| | |
|---|---|
| පළමු වසර | **exam1@arts.cmb.ac.lk** |
| දෙවන වසර | **exam2@arts.cmb.ac.lk** |
| තෙවන වසර | **exam3@arts.cmb.ac.lk** |
| සිව්වන වසර | **exam4@arts.cmb.ac.lk** |

**විභාග විෂමාචාරය**

1. විභාග විෂමාචාරයට අදාළ සියලුම නීති /රීති අන්තර්ජාල පරීක්ෂණවලදී ද අදාළ වේ. පහත සඳහන් නීතිරීති පිළිබඳව අපේක්ෂකයින් විශේෂයෙන් අවධානය යොමු කළ යුතු වේ.
   a) ඉදිරිපත් කළ සියලුම ඇගයීම් ශිෂ්‍යයාගේ ස්වාධීන රචනයක් විය යුතුය. මූලාශ්‍රය භාවිතයේ දී ඒ පිළිබඳ නිසි ලෙස දැක්විය යුතු ය.
   b) ඔබේ පිළිතුර ලිවීමේදී වෙනත් අයෙකුගේ ආධාර උපකාර ලබා ගැනීම හෝ වෙනත් අපේක්ෂකයෙකුට ආධාර ලබා දීමෙන් වළකින්න.
   c) පිළිතුරුපත්‍රවල තිරපිටපත් ගැනීම, වෙනත් අයෙකු සමඟ හුවමාරු කර ගැනීම හෝ වෙනත් මාධ්‍යයක් හරහා ප්‍රශ්න සහ / හෝ පිළිතුරු පිටපත් කිරීම හා හුවමාරු කර ගැනීමෙන් වළකින්න.
   d) විභාග කාල සීමාව තුළ විභාගයට අදාළ විෂය කරුණු පැහැදිලි කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොකළ යුතුය.
2. කිසියම් අපේක්ෂකයෙකු විභාග විෂමාචාරයකට වැරදිකරු වුවහොත් එවැනි ඕනෑම අපේක්ෂකයෙකුට එරෙහිව පියවර ගන්නා බව සලකන්න.

**ආබාධ සහිත සිසුන් සඳහා පහසුකම් සැපයීම**

1. ආබාධිත සිසුන් විභාගය අතරතුරදී ඇති විය හැකි විශේෂ අවශ්‍යතා ඇත්නම් ඒ බව විභාගය ආරම්භ වීමට සතියකට පෙර 0112 580835 යන දුරකථන අංකයෙන් ආබාධිත අධ්‍යයන, පර්යේෂණ හා පුහුණුවීම් පිළිබඳ මධ්‍යස්ථානය (CEDREP) යටතේ ඇති ආබාධිත සිසුන් සඳහා වන සහාය මධ්‍යස්ථානයට (SCSD) දැනුම් දිය යුතු ය.
2. දෘශ්‍යාබාධිත සිසුන්ට විභාග ප්‍රශ්න පත්‍රය/ ඇගයීම කියවීමට සහ / හෝ ලිවීමට සහාය ලබා ගත හැකි ය. ආධාර සපයන පුද්ගලයා **<u>කිසිදු විශ්වවිද්‍යාලයකට අනුබද්ධ ශිෂ්‍යයෙකු නොවිය යුතුය</u>**. ප්‍රකාශන පෝරමයට ආධාර සපයන පුද්ගලයා අත්සන් කළ යුතු අතර අවශ්‍ය තොරතුරු (නම, සම්බන්ධතා අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකය) එහි අඩංගු විය යුතු ය. ප්‍රකාශන පෝරමය LMS වෙතින් ලබා ගත හැකි අතර පිළිතුරු පිටපත සමඟ ඉදිරිපත් කළ යුතු ය (ඇමුණුම II).
3. ලියාපදිංචි වී ඇති නමුත් වෛද්‍ය හේතූන් මත හෝ වෙනත් සාධාරණ හේතූන් මත විභාගයට පෙනී සිටීමට නොහැකි වූ සිසුන් ලිඛිත ඉල්ලීමක් තොරතුරු හා ලේඛන මධ්‍යස්ථානයට (IDC) ලබා දිය යුතු ය. එවැනි ඉල්ලීම් එක් එක් සිද්ධිය අනුව අනුමැතිය සඳහා සලකා බැලීමට පීඨ සභාවට යොමු කරනු ලැබේ.

******

උපලේඛනය I

**සිසුන් සඳහා ප්‍රකාශන පෝරමය**

**සිව්වන / තෙවන / දෙවන / පළමු වසර පරීක්ෂණය දෙවන සෙමෙස්තරය - 2019/2020**

**ශාස්ත්‍ර පීඨය , කොළඹ විශ්වවිද්‍යාලය**

**පාඨමාලාවේ නම-**

**පාඨමාලා කේතය -**

**විභාග අංකය -**

| ප්‍රශ්න අංකය | වචන සංඛ්‍යාව/පිටු ගණන |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

පිළිතුරු පත්‍රයේ සම්පූර්ණ පිටු ගණන-

යොමු කළ දිනය-

මෙම පිළිතුරු පත්‍රය මවිසින් ස්වාධීන ලෙස ලියන ලද්දක් බවත්, මෙහි ලා භාවිත කර ඇති මූලාශ්‍රය නිසි ලෙස දක්වා ඇති බවත් (ආශ්‍රිත ග්‍රන්ථ ලෙස) ප්‍රකාශ කරමි.. එමෙන් ම, අන් අයෙකුගේ පිළිතුරක් මාගේ පිළිතුරක් ලෙස යොමු කිරීම විභාග විෂමාචාරයක් බව මම දන්නා බවත් ප්‍රකාශ කරමි.

……………………..
අත්සන

## උපලේඛනය II

### ආබාධ සහිත සිසුන් සඳහා ප්‍රකාශන පෝරමය
### සිව්වන / තෙවන / දෙවන / පළමු වසර පරීක්ෂණය දෙවන සෙමෙස්තරය - 2019/2020
### ශාස්ත්‍ර පීඨය , කොළඹ විශ්වවිද්‍යාලය

**පාඨමාලාවේ නම-**

**පාඨමාලා කේතය -**

**විභාග අංකය -**

**සහායකයාගේ නම -**

**සහායකයාගේ ජා.හැ.අං. -**

| ප්‍රශ්න අංකය | වචන සංඛ්‍යාව/පිටු ගණන |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

පිළිතුරු පත්‍රයේ සම්පූර්ණ පිටු ගණන-
යොමු කළ දිනය-

**ශිෂ්‍යයාගේ ප්‍රකාශය**

මෙම පිළිතුරු පත්‍රය මවිසින් ස්වාධීන ලෙස ලියන ලද්දක් බවත්, මෙහි ලා භාවිත කර ඇති මූලාශ්‍රය නිසි ලෙස දක්වා ඇති බවත් (ආශ්‍රිත ග්‍රන්ථ ලෙස) ප්‍රකාශ කරමි. එමෙන් ම, අන් අයෙකුගේ පිළිතුරක් මාගේ පිළිතුරක් ලෙස යොමු කිරීම විභාග විෂමාචාරයක් බව මම දන්නා බවත් ප්‍රකාශ කරමි.

..........................
අත්සන

**සහය සපයන පුද්ගලයා විසින් කරන ලද ප්‍රකාශය**

මෙම පිළිතුරු පත්‍රයේ අඩංගු කරුණු ශිෂ්‍යයාගේ මුල් සිතුවිලි / අදහස් බව මම ප්‍රකාශ කරමි (විභාග අංකය:). මෙම පිළිතුරු ලිවීමේ ක්‍රියාවලියේ දී මාගේ සහය ලබා දී ඇත්තේ ප්‍රශ්න පත්‍රය කියවීමට සහ ශිෂ්‍යයාගේ ප්‍රතිචාර ලිඛිතව සටහන් කිරීමට පමණක් බව ද ප්‍රකාශ කරමි.

..........................
අත්සන